# අපූරු යාලුවා



ඔනේලි හේසාරා ගුණරත්න

# අපූරු යාලුවා

ඔනේලි හේසාරා ගුණරත්න

කර්තෘ

මහමායා බාලිකා විදුහල

1 - A

2025 පෙබරවාරි 08

ISBN : 978 624 208 504-3

# පිදුම

මාගේ අම්මා සහ අප්පච්චි ට ද,

ගුරු මෑණිවරුන්ට ද

ආදරයෙන්

මෙම පොත පිළිගන්වමි.

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නඟා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂී සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන "හෙරණගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතර පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය
ශශිකලා සේනාධීර
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.



එක ගමක හිටියා පිංකි කියලා ගෑණු ළමයෙක්, එයාගේ අම්මයි තාත්තයි නෑ.

පිංකි හිටියේ අත්තම්මා එක්ක.

පිංකිට යාලුවෙක් හිටියා එයාගේ නම වෙයිස්. එයා බල්ලෙක්.



දවසක් පිංකි වෙයිස් එක්ක කැලේට යනවා පලතුරු හොයන්න.

රස රස පලතුරු ගොඩාක් තිබුණා.



ලස්සන කුමාරිකාවක් පිංකිව දැක්කා. එයා පිංකි ලඟට ගිහින්

"එන්න දරුවෝ මම ඔයාට පලතුරු ගොඩක් දෙන්නම්" කිව්වා.

පිංකි කුමාරිකාව ලඟට ගියා. කුමාරිකාව පිංකිව එයාගේ මාළිගාවට එක්කගෙන ගියා.

ඒත් වෙයිස් මාළිගාව ඇතුලට ගියේ නෑ.



කුමාරිකාව පිංකිව ඇතුළට එක්කගෙන ගිහිල්ලා "අර කාමරේ පලතුරු ගොඩාක් තියෙනවා. ඔයාට ඇති තරම් ගන්න කිව්වා."

පිංකි කාමරේට ගියාම කුමාරිකාව පිංකිව දාලා දොර වැහුවා.



එයා කුමාරිකාවක් නොවේ. මායාකාරියක්.

"හහ් හහ් හා..... අද මගේ රෑ කෑම තමයි ඔයා" මායාකාරිය කිව්වා.

පිංකි බය වෙලා අඬනවා. වෙයිස් මේක හොරෙන් අහගෙන ඉන්නවා.



වෙයිස් හිමීට මාළිගාවට රිංගලා පිංකි ඉන්න කාමරය ළඟට යනවා.

වෙයිස් කියනවා "බය වෙන්න එපා යාලුවා මම ඔයාව බේරගන්නම්."

මායාකාරිය කාමරය ළඟට ඇවිත් දොර අරිනකොට වෙයිස් මායාකාරිගේ ඇඟට පනිනවා.

මායාකාරිය බිමට වැටුණා.

මායාකාරිය වැටුන පාර එයාගේ මායා යෂ්ටිය බිමට විසිවුණා.

පිංකි යෂ්ටියත් අහුලාගෙන කාමරෙන් එළියට ඇවිත් යෂ්ටියෙන් දොර වැහුවා.



ඉක්මනින් පිංකි සහ වෙයිස් එළියට දුවගෙන ඇවිත් පාර දිගේ ඉක්මන්ට ගෙදර ආවා.

පිංකි වෙයිස්ට ස්තූති කරා.

ඔයා තමයි මගේ හොඳම යාලුවා.

ස්තූතියි මාව බේරගත්තට.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවක් සාහිත්‍ය නිර්මාණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවක් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආශ්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයිත මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාශිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්